# හා පැටියාගේ අදහස



ඩී.එම් සදලි උගෂණී දීගල

ග්‍රන්ථ නාමය :-  හා පැටියාගේ අදහස

කථාව පිටකවරය හා  චිත්‍ර :- ඩී.එම් සඳලි උෂණි දීගල

මෙම කෘතියෙහි සියලුම අයිතිය කතෘ සතුය...

ප්‍රකාශය හා පළමු මුද්‍රණය :  2025 පෙබරවාරි 08

ISBN  අංකය :-  978-624-208-756-6

**පිදුම**

**මාගේ ලේඛන කුසලතාව වර්ධනය කර ගැනීම සඳහා මඟ පෙන්වූ මහාමායා විදුහලේ 3- B පන්තියේ වත්සලා ගුරුතුමියට හා ආදරණීය දෙමව්පියන්ටත්, ග්‍රන්ථය නිමාකර ගැනීමට සහය දුන් සියලුම දෙනාටත් සැකසූ මෙම ග්‍රන්ථය පිළිගන්වමි.**

**ඩී.එම් සඳලි උගෂණි දීගල**

**3 ශ්‍රේණිය B**

**මහාමායා බාලිකා විදුහල**

**මහනුවර**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණියුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **හෙරණගත්කරණී** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක වනයක විශාල ගුහාවක් තිබුණා. ඒ ගුහාවේ හා දෙනකුයි, හා පැටියෙකුයි ජීවත් වුණා. හා පැටියගේ නම පිංකි. පිංකි සුදුම සුදු ලස්සන හා පැටියෙක්. පිංකි කරුණාවන්තයි වගේම දක්ෂයි. පිංකි ඉගෙන ගන්න යන්නේ කැලෑ ගමේ පෙර පාසලටයි.



පිංකිගේ අම්මට කාර් එකක් තිබුණා. පිංකි හැමදාම ඉස්කෝලෙට යන්නෙයි, එන්නෙයි කාර් එකේ අම්මත් එක්ක. පිංකි ඉස්කෝලෙට යන්න හරීම කැමතියි. හවසට පිංකි යාළුවොත් එක්ක සෙල්ලම් පිට්ටනියට ගිහින් සෙල්ලම් කරනවා. පිංකිගේ යාළුවෝ තමයි අලි බබා, මුව පැංචා, ජීරාෆ් බබා සහ වඳුරු පැංචි. ඒ ගොල්ලො හැමදාම හවසට සෙල්ලම් කරනවා.









පිංකි ගෙදර ඇවිත් සතුටින් ගෙදර වැඩ කරනවා. අම්මාට උදව් කරනවා. රෑට පිංකි නිදාගන්න කලින් පිංකිගේ අම්මා පිංකිට කතන්දරයක් කියලා දෙනවා.

ඔන්න ඒ කතන්දරයකින් කොටසක් -

“සුරංගනාවියෝ ෆැනාට කියනවා.. ෆැනා ඔයා අපිට ගොඩක් උදව් කළා. දැන් අපි ඔයාට රත්තරං තෑග්ගක් දෙනවා...

ෆැනා සුරංගනා ලෝකයේ ගේට්ටුවෙන් එළියට එද්දී, ෆැනාගේ කකුළ ළඟට එනකන්....” -

“ඉතුරු කොටස හෙට පිංකි....” කියපු අම්මා,  ඔන්න කතන්දර කොටස ඉවර වුණාට පස්සේ පිංකිට නින්ද ගිහින් කියලා දැක්කා...

පිංකිගේ අම්මත් නිදා ගත්තා. ඊළඟ දවස සෙනසුරාදා දවසක්.

පිංකි උදෙන්ම නැඟිටලා මූණ හේදුවා. ඊට පස්සේ වත්ත පහළට ගිහින් බැලුවා.. අම්මා කෝ.. කියලා. එතකොටම පිංකි දැක්කා ලොකු බිම්මලක්. ඒක හරි ශක්තිමත් සහ පෙති කැඩෙන්නේ නෑ. පිංකි ඒ බිම්මල දිහා පැයක් වගේ කාලයක් බලන් හිටියා. ඊට පස්සේ පිංකි දැක්කා ඒකට වඩා චුට්ටක් පොඩි බිම්මලක්...



ඒ බිම්මල විශාල බිම්මලත් එක්ක ගැව්ලා. පිංකිගෙ ඉස්සරහා එයාගෙ අම්මා,

"ඇයි පිංකි මෙතනට වෙලා කල්පනා කරන්නේ..?" කියලා පිංකිගේ අම්මා ඇහුවා.

"නෑ.. අම්මේ මට ආස හිතුනා ඒකෙ උඩට නගින්න.." කියලා පිංකි අම්මට කිව්වා.

"ඕනෙ නම් නැගලා බලන්න.. එහා පැත්තේ, තණකොළ සිනිඳුයි නේ"... කියලා පිංකිගේ අම්මා කිව්වා.

"හරි අම්මේ.." කියලා පිංකි කිව්වා.




පිංකි ඒ ලස්සන බිම්මලට නැගලා සීසෝ පැද්දා. පිංකි ඉරිදා දවසේ එයාගේ යාළුවන්වත් එක්කන් ආවා.

"හෙට සඳුදා .. පිංකි.. පොත් බෑග් එක හදාගන්න.." පිංකිගේ අම්මා කිව්වා.

"මම දැන් යනවා අම්මේ.." කියලා ගුහාව ඇතුළට පිංකි ගියා.

පිංකි ගුහාවට ගිහින් පොත් බෑගය අස් කරලා.. කාලා නිදා ගත්තා.



පිංකි ඉස්කෝලේ සිකුරාදා වෙනතුරු ගියා. පිංකිලාට සිකුරාදා ඉදලා දෙසැම්බර් අන්තිම වෙනකල් නත්තල් නිවාඩු. ඔන්න සිකුරාදා හවස පිංකි යාළුවොත් එක්ක සෙල්ලම් කරලා ඉවර වුණා.

පිංකි අනිත් යාළුවන්ගෙන් මෙහෙම ඇහුවා.. "නිවාඩු නිසා අපේ වත්ත පහළ සෙල්ලම් ගෙදරක් හදමු..?"

" එහෙනම් පිංකි අපි හෙටම සෙල්ලම් ගෙදර හදමු."



“හරි..” කියලා පිංකි ගුහාවට ගිහින් ගෙදර වැඩ කළා.

සෙල්ලම් ගෙදරට අවශ්‍ය දේවලුත් හොයා ගත්තා. පිංකි හවස ගෙදර ඇවිත් කාලා නිදා ගත්තා.

උදේම පිංකි නැගිටලා මූණ හෝදගත්තා.

සෙල්ලම් ගෙදරට ඕන කරපු බඩු ටික ගත්ත පිංකි වත්ත පහළ බිම්මල් දෙක ළඟ තිබ්බා.



ඔන්න පිංකිගේ යාළුවෝ ආවා. පිංකියි, එයාගේ යාළුවොයි සෙල්ලම් ගෙදර හැදුවා. ඊට පස්සේ හැමෝම සෙල්ලම් ගෙදරේ තීන්ත ගෑවා. පිංකි ළඟ අමතර ලී කැබැල්ලක් තිබුණා. පිංකි ඒක බිම්මලේ තිබ්බා. දැන් ඔන්න යාළුවෝ සෙල්ලම් කරන්න පටන් ගත්තා. ඊට පස්සේ ඒගොල්ලො හැමදාම සෙල්ලම් කරමින්, නිවාඩු කාලයත් ගත කරමින් සතුටින් ජීවත් වුණා.



නිමි.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්